# 01. සතර කන් මන්ත්‍රණය

**01. සතර කන් මන්ත්‍රණය ඇතුළත් ජාතක කතාව.**

- උම්මග්ග ජාතකය

**02. උම්මග්ග ජාතකය ඇතුළත් මුල් කෘතිය.**

- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ

**03. සිංහල ජාතක පොත රචනා වීම සඳහා මූලාශ්‍ර වූ කෘතිය.**

- පාලි ජාතකට්ඨ කථාව (අටුවාචාරී බුද්ධඝෝෂ හිමි)

**04. සිංහල ජාතක පොත රචනා වූ යුගය.**

- කුරුණෑගල සාහිත්‍ය යුගය (14 වන සියවස)

**05. සිංහල ජාතක පොත රචනා වන විට එම යුගයේ පාලකයා.**

- හතරවන පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා

**06. කුරුණෑගල රාජධානිය පෙර හැඳින්වූ නම්.**

- ඇතාගල, ඇතුගල, ඇතුගල්පුර

**07. කුරුණෑගල රාජධානිය තුළ රාජ්‍ය පාලනය කළ රජවරු.**

- දෙවන බුවනෙකබා රජතුමා
- හතරවන පැරකුම්බා රජතුමා
- තුන්වන බුවනෙකබා රජතුමා
- පස්වන බුවනෙකබා රජතුමා

**08. සිංහල ජාතක පොතේ කර්තෘ වනුයේ,**

- සොලී මහා සාමි ඇතුළු කර්තෘ මණ්ඩලය/ බහු කර්තෘ

**09. සිංහල ජාතක පොත රචනා කිරීමට අනුග්‍රහය ලබාදුන්නේ,**

- වීරසිංහ පතිරාජ ඇමති

**10. සිංහල ජාතක පොතෙහි කතා ප්‍රමාණය,**

- 547

**11. ජාතක කතා 03 ක් අඩුවුවත් පන්සිය පනස් යනුවෙන් හඳුන්වා ඇති හේතුව,**

- ගණ පූරණය සැකසීම සඳහා


තිලක් ජයසිංහ
( B.A., M.A. Dip in media Studies)

**12. සිංහල ජාතක කතාවක ආකෘතිය**

- වර්තමාන කතාව
- අතීත කතාව
- සමෝධානය (පූර්වාපර සන්ධි ගැළපීම)

**13. කුරුණෑගල යුගයේ ලියවුණු කෘති,**

- පන්සිය පනස් ජාතක පොත
- සිංහල බෝධි වංශය
- ථූපවංශය
- උම්මග්ග ජාතකය
- දළදා සිරිත
- අනාගත වංශය
- සඳකිඳුරු දා කව
- දළදා පූජාවලිය

**14. කුරුණෑගල යුගයේ පැවති පිරිවෙන්,**

- කුරුණෑගල ශ්‍රී පරාක්‍රමබාහු පිරිවෙන
- ගඩලාදෙණිය සද්ධර්මතිලක පිරිවෙන
- ලංකාතිලකයේ ලංකා සෙනවිරත් පිරිවෙන

**15. පාලි ජාතකට්ඨ කතාව අයත් වනුයේ,**

- ඛුද්දක නිකායට

**16. ජාතක කතා යනු,**

- බෝධිසත්වයන් වහන්සේ අතීත ආත්මභාවයන් සම්බන්ධ උප්පත්ති කතාය.

**17. ජාතක පොතෙහි ඇතුළත් දීර්ඝතම ජාතක කතාව,**

- උම්මග්ග ජාතකය

**18. එම ජාතකයට උම්මග්ග යන වචනය යෙදීමට හේතුව,**

- උමඟක් ගැන විස්තර වීම නිසා

**19. උම්මග්ග ජාතක කතාවේ විශේෂ ලක්ෂණ,**

- වර්තමාන කතාවක් නැත.
- විශාලතම ජාතක කතාව වීම.

**20. උම්මග්ග ජාතකයෙන් නිරූපිත පාරමිතාව.**

- ප්‍රඥා පාරමිතාව

**21. උම්මග්ග ජාතකයෙන් නිරූපණය වන බොධිසත්ව චරිතය**

- මහෞෂධ පඬිතුමා

**22. උම්මග්ග ජාතක කතාව රචනා වීමේ අරමුණ,**

- මහෞෂධ පඬිතුමාගේ බුද්ධි මහිමය ප්‍රකාශ කිරීමයි.

**23. උම්මග්ග ජාතකය නිර්මාණය වී ඇති ශෛලය**

- ශ්‍රව්‍ය ගෝචර දේශිය ශෛලියකට අනුව නිර්මාණය වී ඇත.

**24. උම්මග්ග ජාතකයෙන් පෙළ පොතට උපුටාගත් කොටස**

- සතර කන්මන්ත්‍රණයේ සිට ධර්ම යුද්ධය දක්වා

**25. සතර කන්මන්ත්‍රණයෙහි ඇතුළත් චරිත,**

- උත්තර පඤ්චාල නුවර රජු ( චූලනී බ්‍රහ්මදත්ත රජු)
- මියුලු නුවර වේදේහ රජු
- කේවට්ට බමුණා
- මහෞෂධ පඬිතුමා
- ගිරා පෝතකයා
- තලතා තුමිය ( චූලනී බ්‍රහ්මදත්ත රජුගේ මව)
- ඔක්සියයක් රජවරු
- සේනක, පුක්කුස, කාවින්ද, දේවින්ද

**26. චූලනී බ්‍රහ්මදත්ත රජුගේ පුරෝහිත බමුණා,**

- කේවට්ට බමුණා

**27. මියුලු නුවර රජුගේ උපදේශකවරු**

- සේනකය (උකුස්සා)
- පුක්කුස (බඹරා)
- කාවින්ද (වඳුරු තඩියාගේ පුතා)
- දේවින්ද (නීචයා)

**28. චතුරාංගනී සේනාව**

- ඇත් සේනාව - 21870
- අස් සේනාව - 65510
- රිය සේනාව - 21870

- පාබල සේනාව - 109350

  එකතුව - 218600 (අටළොස් අත්ෂෞහිනියක් සේනාව)

**29. සතර කන් මන්ත්‍රණයට යොදාගෙන ඇති අනුප්‍රාසවත් භාෂා**

- කොත් කරක් සේ දික්වූ කර ඇති
- විළඳ කවා මී පැන් පොවා
- තු තු කොට පියා
- බිඳි බිඳි දිවෙන්නා වූ
- මුබ එව, ඔබ යව, ශ්‍රද්ධ කරව, පමා නොවව

**30. නියමිත පාඩම් කොටසේ හමුවූ උපමා,**

- සිංහ නාද ඇසූ මුව පොව්වන් පරිද්දෙන්
- මඟුල් උයන නඳුන් උයනක් සේ
- දණ්ඩකින් පහරන ලද සර්ප රාජයකු සේ
- ගින්නෙන් නැගි දුම් කඳ සේ
- සිංහයෙකු මෙන්
- මුදු පරගනා සේ
- නිගණ්ඨ සේනාවක් පරිද්දෙන්
- කොමඩු බානා සේ
- රජහු කටින් බස උදුරා ගත්තා සේ
- ඉතා තිල් වලා සමූහයක් සේ
- පොළව මැඩ පියන්නා සේ
- රන් වද මලක් සේ

**31. නියමිත පාඩම් කොටසේ හමුවූ රූපක,**

- කෝප නැමැති වාතයෙන්
- කෝප නැමැති ගින්නෙන්
- සිත් නැමැති ආකාශ ගංගායෙහි
- සේනා නැමැති සමුද්‍රයෙන්
- ප්‍රඥා නැමැති සූර්යයා

## 02. ගුත්තිල වෙන නද

**01. ගුත්තිල වෙණ නද ඇතුළත් කාව්‍ය**

- ගුත්තිල කාව්‍ය

**02. ගුත්තිල කාව්‍ය රචනා වූ යුගය**

- කෝට්ටේ යුගය

**03. එකල රාජ්‍ය පාලකයා**

- සිරි පැරකුම්බා රජු (VI පරාක්‍රමබාහු රජු)

**04. ගුත්තිල කාව්‍ය රචනා කළ රචකයා**

- වෑත්තෑවේ හිමි

**05. කතුවරයාගේ ගුරුවරයා**

- තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

**06. පද්‍ය සංඛ්‍යාව**

- 511 යි.

**07. මුල් කෘතිය රචනයට ආරාධනා කරනු ලැබුයේ,**

- සලාවත ජයපාල අගමැතිවරයා

**08. ගුත්තිල කාව්‍යයට පදනම් වූ ජාතක කතාව වනුයේ,**

- ගුත්තිල ජාතකය - 237

**09. ගුත්තිල කාව්‍යයට පදනම් වූ ජාතකයෙන් කියවෙන විශේෂ කරුණ**

- ගුත්තිල - මූසිල ගුරු ගෝල ගැටුම

**10. ගුත්තිල කාව්‍යයෙහි ඇතුළත් රසවත් වර්ණනා**

- උදේනිපුර වැනුම
- සුරඟන රැඟුම් වැනුම
- ගුත්තිල වෙණ නද වැනුම
- ගුත්තිල පඬිතුමාගේ දෙව්ගොව ගමන වැනුම

**11. මුල් කෘතිය රචනා කිරීමට ආරාධනා කිරීමට හේතුව,**

- වෑත්තෑවේ හිමි ශ්‍රී රාහුල හිමියන්ගේ සිත නොරිදවූ බවත්, තමා අකෘතඥවකු නොවන බවත් කීමටයි.

**12. මුල් කෘතිය අයත් කාව්‍ය සම්ප්‍රදාය**

- ඛණ්ඩ කාව්‍ය

**13. ගුත්තිල කාව්‍ය ලියා තිබෙන ගණය**

- වායු ගණය

**14. වායු ගණයේ විශේෂත්වය**

- ලඝු අකුරු තුනක් හා ගුරු අකුරකින් යුතු වායු ගණයෙන් කවිය ආරම්භ කළ විට අනිෂ්ට විපාක සිදුවන බව ජනප්‍රවාදයේ දැක්වේ.

**15. වායු ගණයෙන් කෘතිය ලිවීමට හේතුව,**

- තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සමග පැවති අමනාපය හේතුවෙන් තමාගේ සිතෙහි ගුරුවරයා කෙරෙහි අගෞරවයක් නැති බව දැක්වීම සඳහා.

**16. ගුත්තිල කාව්‍යයට යොදාගෙන තිබෙන විරිත්,**

- ගී විරිත
- පෙද විරිත
- නූපුන් සඳ විරිත

**17. මුල් කෘතියේ සඳහන් ප්‍රධාන චරිත**

- ගුත්තිල ඇඳුරුතුමා
- මූසිල ශිෂ්‍යයා
- සක්විති රජු
- දෙවඟනන්

**18. ගුත්තිල වෙණ නද වැනුම මඟින් කියවෙන විශේෂ කරුණු**

- ගුත්තිල ගාන්ධර්වරයාගේ ජයග්‍රහණය වෙනුවෙන් සක්දෙවිඳුගේ අනුහස ලැබීම.
- මූසිලගේ අකාරුණික බව ප්‍රදර්ශණය වීම.
- ගුත්තිලගේ වෙණ නදින් පරිසැය අපූර්වත්වයට පත්වීම.
- දිව්‍යාංගනාවන්ගේ රැඟුම් අපූර්වත්වය.

## 03. හානා හීය පානා අඩහැරෙන් දැනේ......

**01. ජනකවි යනු,**

- විනිස් සිත තුළ පවතින දුක, කනගාටුව, සතුට, කලකිරීම, කාන්සිය වැනි හැඟීම් හා බැඳුණ කවියයි. (ජනකවි සඳහා කතුවරයෙක් නොමැත)

**02. කෘෂිකර්මාන්තය ආශ්‍රිත ජනකවි**

- ගොයම් කවි
- නෙළුම් කවි

- කුරක්කන් කවි
- පැල් කවි
- කමත් කවි

**03. රැකියා ආශ්‍රිත ජන කවි,**

- පතල් කවි
- ගැල් කවි
- බඹර කවි
- පාරු කවි

**04. කෙළි සෙල්ලම් ආශ්‍රිත ජන කවි,**

- ලී කෙළි
- ඔළිඳ කෙළි
- කළ ගෙඩි නැටුම
- ඔන්චිලි වාරම්

**05. ගොයම් කවි නිර්මාණයට හේතු වූයේ,**

- සී සෑම, වැපිරීම, ගොයම් කැපීම, ගොයම් මැඩවන අවස්ථාවල දී ගොවියාගේ හැඟීම් ඉස්මතු කිරීමට ය.

**06. හානා හීය පානා අඬහැරෙන් දැනේ අයත් කාව්‍ය විශේෂය,**

- දැනමුතු කවි හෙවත් උපදේශනාත්මක කවි

**07. හානා හීය පානා අඬහැරෙන් දැනේ කාව්‍ය පෙළ පොතට උපුටාගත් කෘතිය,**

- සිංහල ජනකවි සංග්‍රහය ( අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව)

**08. ජන කවියට දිගු ඉතිහාසයක් ඇති බව දැක්වෙන කෘතිය,**

- පරමත්ථජෝතිකාව

**09. ජනකවියෙන් දැකිය හැකි විශේෂ ලක්ෂණ,**

- පහසුවෙන් අවබෝධ කරගත හැකි වීම.
- මුඛ පරම්පරාගතව පැවත ඒම.
- කර්තෘ අඥාත වීම.
- ගීතවත් බව.
- විවිධ වෘත්තීන්ට සම්බන්ධ වීම.

**10. ජනකවියෙන් ලද හැකි ප්‍රයෝජන**

- පැරණි ජන ජීවිතය ගැන තොරතුරු දැන ගැනීම.

- පැරණි ආර්ථික තත්වය දැන ගැනීම.
- භාෂාව ගැන හැදෑරීම.
- පැරණි සමාජ තත්වය අවබෝධ කරගත හැකිවීම.

**11. ජනකාව්‍ය සම්ප්‍රදාය ග්‍රන්ථ නිර්මාණයට දායක කරගත් ලේඛකයා.**

- වීදාගම හිමි.

**12. ජනකවියට පාදක වූ අත්දැකීම්**

- දුක
- වේදනාව
- විඩාව
- කාන්සිය
- විරහව
- කනගාටුව
- සතුට
- ප්‍රේමය

**13. නියමිත කාව්‍යයේ යෙදුණු උපහැරණ**

- පතිත රිළවුන්ට ඉණිමං කමක් නැත.
- යුද ඇතිදා නැති කඟ කොස් කොටන්නද
- දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා

14. ජන කවි ඉතිහාසය **අනුරාධපුර යුගය** දක්වා දිව යයි.

## 04. බැද්දේගම........

**01. නවකතාවක් යනු,**

- ලේඛකයා තම පෞද්ගලික අත්දැකීම් පොදු අත්දැකීම් බවට පත්කිරීම සඳහා අවස්ථා, සිද්ධි, චරිත පුළුල් ක්ෂේත්‍රයක තබමින් කලාත්මක විවරණයක් තුළින් අර්ථවත් නව්‍ය දර්ශනයක් පාඨකයාට අත්විඳීමට සලස්වනු ලබන ගද්‍යමට කාව්‍ය නවකතාවකි.

**02. නවකතාවක මූලික ලක්ෂණ,**

- කථනය හා රූපණය
- යථාර්ථ නිරූපණය
- කතාව හා කතා වින්‍යාසය
- චරිත නිරූපණය
- දෘෂ්ටි කෝණය

- පසුබිම හා කාලය
- භාෂා ශෛලිය

**03. සිංහල නවකතාව ආරම්භක නවකතාව,**

- අලුත්ගමගේ සයිමන් ද සිල්වා - මීනා නවකතාව ( 1847-1920)

**04. සිංහල නවකතාවේ ප්‍රගමනයට දායක වූ මුල් නවකතාකරුවන්,**

- සයිමන් ද සිල්වා
- පියදාස සිරිසේන
- ඩබ්ලිව් ඒ සිල්වා
- මාර්ටින් වික්‍රමසිංහ
- ජී. බී. සේනානායක

**05. "බැද්දේගම" වනකතාව සඳහා පාදක වූ මුල් කෘතිය,**

- Village in the jungle

**06. "Village in the jungle" යන නවකතාවේ කතුවරයා,**

- ලෙනාඩ් වුල්ෆ්

**07. Village in the jungle නවකතාව ලියූ වර්ෂය,**

- 1913

**08. ලෙනාඩ් වුල්ෆ් ලංකාවට පැමිණි වර්ෂය,**

- 1904

**09. ලෙනාඩ් වුල්ෆ් ලංකාවේ සේවය කළ දිස්ත්‍රික්කය,**

- යාපනය - 1904
- නුවර - 1907
- හම්බන්තොට - 1908

**10. ලෙනාඩ් වුල්ෆ් දැරූ තනතුර,**

- ඉංග්‍රීසි ආණ්ඩුවේ සහකාර ඒජන්තවරයා

**11. ලෙනාඩ් වුල්ෆ්ගේ බිරිඳ**

- ඇසිලින් වර්ජිනා ස්ටෙෆන්

**12. ලෙනාඩ් වුල්ෆ් මියගිය වර්ෂය,**

- 

- 1969 අගෝස්තු 14 දින එංගලන්තයේ රොඩ්මෙල් හි දී මෙලොවින් සමුගත් අතර ඒ ස්ථානයේ එතුමා වෙනුවෙන් තැනුණු ලෝකඩ ස්මාරකයක් ඇත.

**13. "බැද්දේගම" නවකතාවේ අන්තර්ගතය,**

- දුප්පත් අහිංසක අසරණ ගැමියාගේ දුක්ඛිත භාවය හා කුටෝපක්‍රමවලට හසු වී ක්‍රමයෙන් විනාශ වී යයි ඔවුන්ගේ ජීවිත සිලිඳු හා ඔහුගේ පවුල ඇසුරෙන් නිර්මාණයේ විවරණය වේ.

**14. "බැද්දේගම" නවකතාවේ අනුවර්තකයා,**

- ඒ. පී. ගුණරත්න

**15. Village in the jungle කෘතියේ සිංහල පරිවර්තනය,**

- බැද්දේගම

**16. ඒ.පී. ගුණරත්නයන්ගේ වෙනත් පරිවර්තන කෘති,**

- වානරයා
- වනසරණ
- මැකී ගිය අඩයම
- සුදු නෝනා

**17. "බැද්දේගම" නවකතාව ඇසුරින් බිහිවුණ වෙනත් නිර්මාණ**

- බැද්දේගම චිත්‍රපටය
- බැද්දේගම ටෙලිනාට්‍ය

**18. "බැද්දේගම" නවකතාවේ පරිච්ඡේද ගණන.**

- පරිච්ඡේද 10 යි.

**19. "බැද්දේගම" නවකතාවේ ප්‍රධාන චරිත,**

- සිලිඳු
- පුංචි මැණිකා } සිලිඳු ගේ නිවුන් දරුවන්
- හින්නි හාමි
- බබුන් අප්පු - නැන්චොහාමිගේ සහෝදරයෙකි
- කර්ලිනාහාමි - සිලිඳුගේ සහෝදරියකි (වැන්දඹුව)
- බබෙහාමි - ආරච්චිරාල
- ප්‍රනාන්දු - මුදලාලි
- පුංචිරාළ - කට්ටඩියෙක්/වෙදෙක්
- මහවෙළගම මහල්ලා

- හිරපල්ලා

**20. "බැද්දේගම" නවකතාවේ හමුවන උපමා,**

- තද සුළඟට ඇඹරවී ඇටුවන් බැහීගිය ගඟක් මෙන්
- ගසක පොත්තක් මෙන්
- වඳුරෙකු මෙන්
- මුවැත්තියක් වගෙයි
- බියපත් සිවල් දෙකන මෙන්
- දැලක් මෙන්
- කරුණාව වේලිච්ච කුඹුරට වැස්සක් වගෙයි.

## 05. මුනි සිරිපා සිඹිමින්නේ......

**01. මෙම කවි පෙළ උපුටාගත් මුල් නිර්මාණය වනුයේ,**

- දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල

**02. මෙම කවිපෙළ රචනා කරන ලද්දේ**

- ටිබෙට් ජාතික එස්.මහින්ද හිමි

**03. එම කතුවරයා අයත් යුගය,**

- කොළඹ යුගයේ මුල් පරපුර ( වැඩිහිටි පරපුර)

**04. අන්වර්ථ නාම**

- ලාංකේය නිදහස් සටනේ පුරෝගාමියා

**05. එස්.මහින්ද හිමියන් කවි ලියූ ප්‍රධාන තේමා තුන,**

- ළමා කවි
- දේශාභිමානී කවි
- බුද්ධාභිවන්දනා කවි

**06. මහින්ද හිමි උපත ලද රට හා වර්ෂය**

- ටිබෙටය - 1901

**07. මහින්ද හිමි පැවදි වූයේ,**

- වයස අවුරුදු 12 දීය.

**08. මහින්ද හිමියන්ගේ ගිහි නාමය.**

- ඇස්.කේ. තම්බිනම්ගාල්

**09. මහින්ද හිමි ලංකාවට පැමිණියේ,**

- එස්. පුණ්ණජී හිමියන් ජර්මන් ජාතික ඥානාලෝක හිමියන් සමඟය.

**10. මහින්ද හිමි පැවදි වූයේ,**

- අමරපුර නිකායට අයත් දොඩන්දූවේ ශෛලබිම්බාරාමයේ දීය.

**11. මහින්ද හිමියන් සියම් නිකායට අයත් වූයේ,**

- පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන්පති ලුණුපොකුණේ ශ්‍රී ධම්මානන්ද හිමියන් වෙතින් නැවත පැවිද්ද ලැබීය.

**12. මහින්ද හිමි උපසම්පදා වූයේ,**

- 1931

**13. මහින්ද හිමියන් අධ්‍යාපනය හදාරනු ලැබුයේ,**

- මරදානේ මහාබෝධි විද්‍යාලය
- මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන

**14. මහින්ද හිමි සේවය කළ විදුහල**

- කොළඹ ආනන්ද විද්‍යාලය

**15. මහින්ද හිමියන් ආනන්ද විද්‍යාලයේ ඉගැන්වූ විෂයන්,**

- සිංහල
- පාලි
- බුද්ධාගම

**16. කවිපෙළ සඳහා යොදාගත් විරිත්,**

- උතු ඡන්දයට අයත් යෝන්මන්වැල විරිත

**17. එතුමා විසින් රචිත ජාතිත්‍යාභිමානී කෘති**

- නිදහසේ දැහැන
- නිදහසේ මන්ත්‍රණය
- ලංකාමාතා
- රත්නාවලී
- කුසුමාඤ්ජලී

**18. එතුමා විසින් රචිත ළමා කෘති**


තිලක් ජයසිංහ
( B.A., M.A. Dip in media Studies)

- කවිමිණි
- කවිමුතු
- ළමා කවි කළඹ
- ඔවා මුතු
- නන්දන ගීත

**19. එතුමා විසින් රචිත ගද්‍ය කෘති**

- දෙවන රාජසිංහ චරිතය
- මහා පරාක්‍රමබාහු චරිත කුමාර කාලය
- රාහුල කුමාරයා සහ ශ්‍රී පාද

**20. එතුමා විසින් රචිත පළමු ග්‍රන්ථය**

- ඔවා මුතුදම

**21. එතුමාගේ ජනප්‍රිය වූ ළමා කවි**

- සමන්පිච්ච මල් ඉහිරුණු...
- සුරතල් හොද හා පැටවා....
- මොනවද මුත්තේ මොකද කරන්නේ....
- බතල කොට ඉබ්බේත්

**22. කවි පෙළෙහි එන අනුප්‍රාස,**

- ජාතික රණ දෙරන මතේ
- ගැටී වැටී මළ මොහොතේ
- ඉටුකොට කළ යුතු යුතුකම්
- නැති බැරි හිඟ උවහිරකම්

**23. කවි පෙළෙහි එන රූපක**

- නිදහස මහ මුහුදක් වේ
  එහි උල්පත පුත නුඹ වේ

- ජාතිය රන් විමනක් වේ
  ආගම මිණි පහනක් වේ

**24. මෙම කවි පෙළෙහි අරමුණ,**

- ළමා මනස සෞන්ධර්යය රාසායයෙන් පිබිදවීම.
- ජාතිත්‍යාභිමාන හැඟීම් පුබුදුවාලීම.
- ගුණදහමින් පෝෂිත කරවීම.

- ෘසාස්වාදන ශක්තිය වර්ධනය කරවීම.

## 06. ගංගාවේ සංගීතය

**01. කවි පෙළේ රචකයා,**

- එච්. එම්. කුඩලිගම

**02. කුඩලිගම කවියා අයත් වන යුගය,**

- කොළඹ යුගයේ දෙවන පරපුර (තරුණ පරපුර)

**03. ඔහු ලියූ ප්‍රචලිත කවි පන්ති**

- කුරුළු කූඩුව
- මී වදය
- දේදුන්න
- සිරිමලී
- වැස්ස
- සුවඳ

**04. ඔහු ලියූ පද්‍ය කෘති**

- ඈ
- කුණාටුව
- එකොමත් එක රටක
- සංවාදය

**05. අන්වර්ථ නාමය**

- සිංහල ෂෙලී

**06. ඔහු සේවය කළ පුවත්පත්,**

- සිංහල බලය
- දිනමිණ
- සිළුමිණ
- ජනතා

**07. කුඩලිගම කවියා කාව්‍ය නිර්මාණයේදී දක්ෂතා වූ ක්ෂේත්‍රය**

- ස්වභාව සෞන්දර්යය

**08. කුඩලිගම කාව්‍ය නිර්මාණයේ දී යොදාගත් තේමා,**

- මනුෂ්‍ය ජීවිතය
- සොබාදහම
- ප්‍රේමය

**09. ගංගාවේ සංගීතය ඇතුළත් කාව්‍ය සංග්‍රහය**

- ඇ

**10. ගංගාවේ සංගීතය පෙළපොතට උපුටාගෙන ඇත්තේ,**

- ගීතනාත් කුඩලිගමයන් සංස්කරණය කළ මන්බැඳි පන්හිඳ

**11. එච්.එම්. කුඩලිගමයන්ගේ කවි පළවූ සඟරා,**

- සුවඳ
- දේදුන්න
- මී වදය

**12. කුඩලිගම පෙරදිගග කාව්‍ය සම්ප්‍රදායේ ආභාසය ලැබුවේ,**

- රවීන්ද්‍රනාත් තාගෝර් කිවිඳුන්

**13. ගංගාවේ සංගීතය කවිපෙළ ලිය වී ඇති දෘෂ්ටිකෝණය,**

- උත්තම පුරුෂ දෘෂ්ටිකෝණය

**14. කවි පෙළෙහි කථකයා,**

- ගංගාවයි

**15. කවි පෙළෙහි ආකෘතිය**

- ෂිව්පද හෙවත් සඳැස් ආකෘතියයි.

**16. කවි පෙළ ලියවී ඇති විරිත,**

- ෂමුද්‍රඝෝෂ වෘත්තය ( සමුදුරුගොස් විරිත)

**17. කවි පෙළෙහි භාෂාව**

- සරල කාව්‍යාත්මක භාෂාවකි.

**18. එච්.එම්. කුඩලිගම අභාවප්‍රාප්ත වූයේ,**

- 1973 අගෝස්තු 01

**19. කවිපෙළෙහි අනුප්‍රාසය නිරූපිත අවස්ථා,**

- සැගවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි.
- ඇඹරෙමි එහෙත් පසු නොබසමි නොනවතිමි.
- ගල් පරවල ම හැපි හැපී බිහි කරමි මම.
- ළය යට සසල බව මින්මතු නොනැගෙද්දෙන්.

**20. ගංගාවේ පද්‍ය පන්තියේ විශේෂතා,**

- ගඟ කාන්තාවක සමාන කොට සජීවත්වාරෝපණයෙන් වර්ණනා කොට තිබීම.
- ෂිව්පද ආකෘතියට සුදුසු පරිදි එළිවැට යොදාගෙන තිබීම.
- අනුප්‍රාසවත් බස් වහරක් යොදාගෙන තිබීම.

# 07. ලෙන අතහැර යාම

**01. මෙම පාඩම අයත් නාට්‍ය**

- සිංහබාහු නාට්‍ය

**02. එම නාට්‍ය රචනා කරනු ලැබුවේ,**

- එදිරිවීර සරත්චන්ද්‍රයන් විසිනි.

**03. අන්වර්ථ නාමය,**

- අපේ රටේ පහළ වූ අමරණීය නාට්‍යවේදියා

**04. නාට්‍ය තේමාව වූයේ,**

- මහාවංශයේ දැක්වෙන සිංහල ජාතිය බිහිවීම පිළිබඳ කතා පුවතයි.

**05. සතර අභිනය,**

- ආංගික අභිනය ( ශරීර අවයව චලනය)
- වාචික අභිනය ( වචන හා ගීත)
- සාත්වික අභිනය (මුහුණට ආරූඪ කරගන්නා විවිධ ආවේග)
- ආහාර්ය අභිනය ( නළු නිළි ඇඳුම් පැළඳුම් හා වේදිකා උපකරණය)

**06. නාට්‍යයේ ප්‍රධාන බෙදීම් දෙක,**

- නාට්‍යධර්මී නාට්‍ය ( සංකේත් විධි භාවිතයෙන් නාට්‍ය ඉදිරිපත් කිරීම)
- ලෝකධර්මී නාට්‍ය ( ජීවිතයේ දී කෙනෙකු හැසිරෙන ආකාරයට නළුවා රංගනයේ යෙදීම.)

**07. නාට්‍ය ධර්මී හා ලෝකධර්මී හඳුන්වන තවත් නම්,**

- නාට්‍ය ධර්මී - ශෛලීගත නාට්‍ය/ කාව්‍යමය රංග කලාව
- ලෝක ධර්මී - ස්වභාවික නාට්‍ය/ මායාරූපී රංග කලාව

**08. එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ මුල් නම,**

- යුස්ටන් රෙජිනෝල්ඩ් ද සිල්වා

**09. සිංහබාහු නාට්‍ය ප්‍රථම වරට රංගනය වූයේ,**

- 1961 අගෝස්තු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ එළිමහන් රංගපීඨයේ

**10. රඟහලක ප්‍රථම වරට සිංහබාහු නාට්‍ය ප්‍රදර්ශනය වූයේ,**

- 1961 සැප්තැම්බර් 30 කොළඹ ලයනල් වෙන්ඩ්ට් රඟහල

**11. සිංහබාහු නාට්‍යයේ ප්‍රධාන චරිත,**

- සුප්පාදේවිය
- සිංහයා
- සිංහබාහු
- සිංහසීවලී

**12. ලෙන අතහැර යාම අයත් වන්නේ,**

- සිංහබාහු නාට්‍යයේ අංක 04 දෙවන අංකයයි.

**13. සිංහබාහු නාට්‍යයේ අංක 04 නම් කොට ඇති ආකාරය,**

- ගිරිලෙන් වාසය
- ලෙන අතහැරයාම
- සිංහල රටතොට වැනසීම හා වැසියන්ගේ දුක්ගැනිවිලි
- සිංහයා මරා දැමීම

**14. මහාචාර්යය සරස්චන්ද්‍රයන් දිනූ සම්මාන,**

- මැග්සෙසයි සම්මානය (පිලිපීනය)
- කුමාරන් අශාන් සම්මානය (භාරතය)
- ස්වර්ණ රජත සම්මානය (ජපානය)

**15. මහාචාර්ය එදිරිවීර සරස්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණ**

- මනමේ
- සිංහබාහු

- පබාවතී
- ලෝචනය
- රත්තරන්
- කදා වළලු
- එළොව ගිහින් මෙලොව ආවා
- බවකඩතුරා
- වෙස්සන්තරය
- වෙල්ල වැනුම
- බහින කලාව
- කපුවා කපෝති

**16. ලෙන අතහැර යාම පාඩමේ නිරූපිත උපමා,**

- පින් පිඩ වැනි මා මැණියා
- සවි සැප දෙන සිතුමිණ වන්
- වෙමි දේ තිසරින්දා
- සේ රිවි බිම්බා

**17. සිංහබාහු අයත් නාට්‍යයේ ශෛලීය,**

- ශෛලීගත නාට්‍ය සම්ප්‍රදාය (නාට්‍යධර්මී සම්ප්‍රදාය)

**18. මෙහි අඩංගු ප්‍රබලතම නාට්‍යෝචිත අවස්ථාව**

- නාට්‍යයේ ගැටුමයි. (සිංහබාහු ගල්ලෙන බිඳලෙන් දොර හැර දැමූ අවස්ථාව)

## 08. අගුමල් දමනය........

**01. බණකතා සාහිත්‍යයේ ආරම්භක යුගය,**

- පොළොන්නරු සාහිත්‍ය යුගය

**02. අඟුමල් දමනය පාඩම උපුටා ගනු ලැබුවේ,**

- අමාවතුර කෘතිය

**03. අමාවතුර කෘතියේ රචකයා,**

- ගුරුළුගෝමී පඬිවරයා

**04. රචනා කළ යුගය,**

- පොළොන්නරු යුගය

**05. අමාවතුරේ සඳහන් වන බුදුගුණය,**

- පුරිසධම්ම සාරථී බුදුගුණය

**06. අමාවතුරේ පරිච්ඡේද ගණන,**

- පරිච්ඡේද 18 කි.

**07. අමාවතුරේ ඇතුළත් පරිච්ඡේද 18**

- දූර්දාන්ත දමනය
- ස්වසන්තාන දමනය
- පරසන්තාන දමනය
- ගඟපති දමනය
- රාජ දමනය
- අඟුමල් දමනය
- පරිබ්‍රාජක දමනය
- මානවක දමනය
- දිගම්බර දමනය
- ජටිල දමනය
- තාපස දමනය
- භික්ෂු දමනය
- නාග දමනය
- යක්ෂ දමනය
- අසුර දමනය
- දේව දමනය
- බ්‍රහ්ම දමනය

**08. එක් බුදුගුණයක් අරඹයා ලියන ලද ප්‍රථම පරිශීලනය,**

- අමාවතුර

**09. එක් බුදුගුණයක් අරඹයා ලියන ලද දෙවන පරිශීලනය,**

- පූජාවලිය

**10. එක් බුදුගුණයක් අරඹයා ලියන ලද තෙවන පරිශීලනය,**

- සාරාර්ථ සංග්‍රහය


තිලක් ජයසිංහ
( B.A., M.A. Dip in media Studies)

**11. එක් බුදුගුණයක් අරඹයා ලියන ලද අවසන් පරිශීලනය,**

- ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහය

**12. අමාවතුරේ සඳහන් බුදුරදුන් දමනය කළ අය,**

- නාලාගිරි ඇතා
- උපාලි ගෘහපතියා
- අංගුලිමාල
- ආලවක යක්ෂයා
- කුටදත්ත බමුණා
- බක බමුණා
- සච්චක බමුණා
- අජාසත් රජු
- සභීය පරිබ්‍රාජකයා

**13. අමාවතුර රචනයේ දී කතුවරයාගේ බලාපොරොත්තුව,**

- නොවියත් හුදී ජනන් සඳහා සිය බසින් මා විසින් සැකවින් දක්වනු ලැබේ.

**14. ගුරුළුගෝමී පඬිවරයා විසින් රචිත වෙනත් කෘති,**

- පාලි මහා බෝධි වංශය
- ධර්ම ප්‍රදීපිකාව

**15. අමාවතුරෙහි අඟුමල් දමනය පුවත ඇතුළත් පරිච්ඡේදය**

- 07 වෙනි පරිච්ඡේදය

**16. මෙහි එන බුදු ගුණය කීවෙනි නව අරහාදී බුදු ගුණය ද,**

- 06 වන බුදුගුණය

**17. අඟුමල් දමනය සඳහා පාදක වූ සූත්‍රය හා අටුවාව,**

- මජ්ඣිම නිකායේ අංගුලිමාල සූත්‍රය හා අටුවාව

**18. අහිංසක කුමරා උපන් දිනයෙහි සිදු වූ වැදගත් සිදුවීම් දෙක,**

- කොසොල් රජුගේ අවි දිලිහීම
- සියලු නුවර ආයුධ දිලිහීම

**19. අහිංසක කුමරාට මෙම නම තැබීමට හේතුව,**

- සියලු නුවර දිලිසෙන ආයුද නිසි කෙනෙකුට හිංසාවක් නොකළ නිසා.

**20. අහිංසක මානවයා සාහසික මිනීමරුවකු වීමට හේතුව,**

- සෙසු මානවකකයෝ ආචාර්යයාගේ බිරිඳ හා සසඟ යැයි ඇඳුරුතුමාට දැන්වීම නිසා දිසාපාමොක් ඇඳුරුතුමා විසින් ශිල්පයට උපකාර පිණිස මිනිසුන් දහසක් මැරීමට පැවසීම.

**21. අඟුමල් දමනය කතාවේ ඇතුළත් ගාථාවෙහි අරුත,**

- සමහර කෙනෙක් කෝටුවෙන්, හෙණ්ඩුවෙන්, කසයෙන් දමනය කරති. මම කොටු අවි නැති, කෙලෙස් නැති බුදුන් විසින් හික්මවනු ලැබූයෙමි.

**22. අංගුලිමාල ඇල්ලීමට බුදුන් හමුවීමට ගිය රජතුමා,**

- කොසොල් රජතුමා

**23. අමාවතුර යන්නෙහි අරුත,**

- අමෘත රසයයි.

## 09. උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව

**01. උග්ගසේන සිටුපුත්හුගේ වත ඇතුළත් බණ කථා සංග්‍රහය,**

- සද්ධර්මරත්නාවලිය

**02. සද්ධර්මරත්නාවලිය රචනා වූ යුගය,**

- දඹදෙණි යුගය

**03. සද්ධර්මරත්නාවලයේ රචකයා,**

- ධර්මසේන හිමි

**04. එකළ රජකළ රජතුමා,**

- II වන පරාක්‍රමබාහු රජු

**05. සද්ධර්මරත්නාවලියේ කතා වස්තු ගණන,**

- 315

**06. සද්ධර්මරත්නාවලිය යන්නෙහි අරුත,**

- සද්ධර්මය නැමැති මිණිකැට ඇමුණු මාලය

**07. සද්ධර්මරත්නාවලියේ අරමුණ කුමක් ද?**

- කුසලාකුසල ධර්මාවබෝධය ලබා දීම.
- සඳහම් මඟට සත්පුරුෂයන් යොමු කිරීම.

**08. සද්ධර්මරත්නාවලිය රචනා කිරීමේ අරමුණ වනුයේ,**

- නුවණ මඳවත් කුසලච්ඡන්දය ඇතිව බණ දැන පිංකම හැසිර නිවන් සදාගනිත් නම්.....

**09. සද්ධර්මරත්නාවලියට මූලාශ්‍ර වූ කෘතිය වන්නේ,**

- පාලි ධම්මපදට්ඨ කථාව

**10. මූලාශ්‍ර කෘතියේ කතුවරයා ,**

- බුද්ධඝෝෂ අටුවාචාරීන්

**11. සද්ධර්මරත්නාවලිය මූලාශ්‍ර කෘතියේ සිංහල පරිවර්තනයක් නොවන බව දැක්වෙන පාඨය,**

- පාලි ධර්මය හැර අර්ථ පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයකි.

**12. සද්ධර්මරත්නාවලියෙහි කතුවරයා ධර්මසේන හිමි බව දැක්වෙන ගාථාව,**

| | |
|---|---|
| සද්ධම්මඨිති මිච්චන්තො<br>ධම්මසේන යතිස්සරො<br>අකාසි පවරං එතං<br>සද්ධම්මරත්නාවලිං | සද්ධර්මයේ චිර පැවැත්ම උදෙසා<br>ධර්මසේන නම් වූ යතිවර කෙනෙක් මේ<br>උත්තම වූ සද්ධර්මරත්නාවලිය කළේය. |

**13. සද්ධර්මරත්නාවලියේ උග්ගසේන නම් සිටුපුත්හුන්ගේ කතා වස්තුව කීවෙනි කතාවද ?**

- 256

**14. පාලි කතා වස්තූන් මුල්කොට ගෙන කතා කීමේ ශෛලිය හඳුන්වනුයේ,**

- බණකතා රීතියයි.

**15. සද්ධර්මරත්නාවලියේ විශේෂ ලක්ෂණ වනුයේ,**

- කතා රසය හා දහම් රසය මැනවින් ඉදිරිපත් කිරීම.
- උපමා, රූපක, යෙදුම් උචිත ලෙස භාවිත කිරීම.
- සානුකම්පිත දෘෂ්ටිය

**16. සද්ධර්මරත්නාවලියේ කතුවරයාගේ කතා කලාවේ සුවිශේෂිතා මොනවාද?**

- කතා පුවත ආරම්භයේදී ධර්මෝපදේශ ප්‍රකාශනය
- කතා පුවත අවසානයේදී ධර්මෝපදේශ ප්‍රකාශනය

**17. උග්ගසේන සිටුපුත්හුගේ වස්තුවෙහි එන ප්‍රබලතම චරිත ද්විත්වය,**

- උග්ගසේන සිටු පුත්‍රයා
- විද්වත් දියණිය

**18. වෙනත් චරිත**

- විද්දතාණන්
- උග්ගසේනගේ දෙමාපියන්
- බුදුරජාණන් වහන්සේ

**19. මෙම කතා වස්තුවේ එන උපමා,**

- පෙත්තක් මෙන්
- පැසුණු ගොයම් මුල් වූවා සේ
- කරඟ රහත් වන්නා සේ
- සැට වස් ගිය මහ තෙරුන් මෙන්

**20. මෙම කතා වස්තුවේ එන රූපක**

- රන් දාගැබ
- රූ සම්පත්
- බත් පාත්‍රයක්

**21. මෙම කතා වස්තුවේ එන අනුප්‍රාසාත්මක යෙදුම්,**

- මැසි මත්තෙහි මැසි ගස්වා
- ඒ දෙය මේ දෙය
- කිය කියා නළවයි
- හාව හාව ලීලා
- ඇදි ඇදි සේ
- සී සැරිලා

**22. මෙම කතාවේ එන පූර්ව ක්‍රියා**

- පාවාදීලා
- ගිගි කොටලා
- බණවලා

**23. මෙහි සඳහන් කෙටි වැකකි**

- නටයි, ගීත් ගයයි.
- අපටත් රක්ෂාව නම් ඌම වේද
- මම එතනදී ගාථාවක් කියමි.

**24. සරළ සුංගම බස් වහර,**

- එසේ වී නම් මම උන් හා එක්වෙමි.
- නොලදොත් මියෙමි, ලදොත් ජීවත් වෙමි.
- එසේය, අනෙක් කාට කියම් ද?
- මදුව විකුණන්නා නැත.

**25. උග්ගසේන සිටුපුත්හුගේ වස්තුව රචනා කිරීමේ අරමුණ වන්නේ,**

- යමෙක් යම් දෙයක් ඉගෙන ගන්නේ නම් නිවැරදි ශිල්පයක්ම උගත යුතුය. වැරදි ශිල්ප ඉගෙනීමෙන් මෙලොවට ප්‍රයෝජන ඇතත් පරලොවට කිසිඳු ප්‍රයෝජනයක් නැත.

## 10. කැරගලය වැජබෙයි මේ ලෙසින් සිට.....

**01. සංදේශය යන්නෙහි අරුත,**

- ලියමන
- පණිවිඩය
- ආරංචිය
- දැන්වීම

**02. සන්දේශය යන්න ජාතක කතා පොතෙහි සඳහන් වන ආකාරය වනුයේ,**

- සුතසෝම ජාතනය - "සුතසෝම රජ්ජුරුවන්ට සංදේශය යැවූහ."

**03. ලොව මුල්ම සන්දේශ කාව්‍ය,**

- උතුරු ඉන්දියාවේ මහා කවි කාලිදාසගේ මේඝදූතය

**04. සන්දේශයක මූලික කරුණු 04,**

- සන්දේශය යවන්නා
- සන්දේශය ගෙනයන්නා
- සන්දේශය ලබන්නා
- සන්දේශය

**05. සන්දේශ කාව්‍යයක පොදු ලක්ෂණ,**

- දූතයා වර්ණනා කිරීම.
- දූතයාට කළයුතු කාර්යය දැනවීම.
- පෙරමග සුබ නිමිති දැක්වීම.
- මාර්ග වර්ණනා කිරීම.
- සන්දේශය ලබන්නා වර්ණනා කිරීම.

- සන්දේශය දැක්වීම හා දූතාශිර්වාදය.

**06. ලක්දිව මුල්ම සන්දේශ කාව්‍ය**

- මයුර සන්දේශය
- තිසර සන්දේශය

} ගම්පොළ යුගය

**07. ලක්දිව ශ්‍රේෂ්ඨ සන්දේශ**

- මයුර සන්දේශය
- තිසර සන්දේශය

} ගම්පොළ යුගය

- පරෙවි සන්දේශය
- සැළලිහිණි සන්දේශය
- කෝකිල සන්දේශය
- ගිරා සන්දේශය

} කෝට්ටේ යුගය

- හංස සන්දේශය
- සැවුල් සන්දේශය - සීතාවක යුගය

**08. කෑරගල වැනුම ඇතුළත් සන්දේශ කාව්‍ය**

- හංස සන්දේශය

**09. හංස සන්දේශයෙහි කතුවරයා වනුයේ,**

- වීදාගම මෛත්‍රීය හිමි

**10. හංස සන්දේශයේ නියමිත කවි ගණන වන්නේ,**

- 206

**11. හංස සන්දේශය රචනා වනුයේ,**

- කෝට්ටේ යුගයේ දීය.

**12. හංස සන්දේශයේ සන්දේශය ලබන්නා වූයේ,**

- කෑරගල පද්මාවතී පිරිවෙන්පති වනරතන හිමි.

**13. හංස සන්දේශ කතුවරයාගේ වෙනත් ග්‍රන්ථ මොනවාද?**

- බුදුගුණ අලංකාරය
- ලෝවැඩ සඟරාව
- දහම් ගැට මාලාව
- කවි ලකුණු මිණිමල

**14. මෙම යුගයේ රාජ්‍ය පාලනය සිදු කරනු ලැබුයේ,**

- VI වන පරාක්‍රමබාහු රජතුමා

**15. හංස සන්දේශයේ භාරකාරයා වන්නේ,**

- ශංසයා

**16. හංස සන්දේශයේ ප්‍රතිග්‍රාහකයා වූයේ,**

- වනරතන හිමි

**17. හංස සන්දේශයෙහි ග්‍රන්ථ නිමිත්ත,**

- කැරගල වනරතන හිමියන් විසින් සමන්, විභීෂණ, උපුල්වන් , කඳ කුමරු යන දෙවිවරුන්ට පිරිත් කියා පින් දී සිරි පැරකුම්බා රජ කෙරෙහි කරුණාවෙන් සත සලසන ලෙස ඉල්ලීමයි.

**18. රසවාහිනියේ කැරගල හඳුන්වන නම,**

- වත්ථුලපබ්බත

**19. ගමෙහි භෞතික දියුණුව හා ජනතාවගේ ආධ්‍යාත්මික දියුණුව සංකේතවත් වනුයේ,**

- කැරගල පද්මාවතී පිරිවෙන මගිනි.

**20. මෙය අදාළ සාහිත්‍ය වර්ගය වන්නේ,**

- සන්දේශ කාව්‍ය

**21. හංස සන්දේශය ලියවුණේ,**

- ක්‍රි.ව. 1457

**22. හංසයාගේ ගමන් මාර්ගය වන්නේ,**

- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සිට කැරගල පද්මාවතී පිරිවෙන දක්වා.

**23. හංස සන්දේශයේ ආකෘතිය**

- සිව්පද ආකෘතිය

**24. හංස සන්දේශයට යොදාගන්නා ලද විරිත් මොනවාද?**

- සමුද්‍රඝෝෂ විරිත
- සත්වා විරිත
- පදක විරිත
- යොන්මත්වැල විරිත

**25. එකම විරිතකින් ලියවුණු සන්දේශය වනුයේ,**

- සැළලිහිණි සන්දේශය - සමුද්‍රඝෝෂ විරිත

**26. මෙහි සඳහන් උපමා වන්නේ,**

- සතර'ත එකට සම කර බෙර ඇසක් මෙනි.
- මිහිකත සඳන්'ලෙව් දුන් උන් මඬලල වැනි.
- දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට.
- කිරඹ පොකුරු මී රස ලැබ බොන ලෙසට.

**27. මෙහි ඇති අනුප්‍රාසාත්මක යෙදුම්,**

- දොළින් දොළම
- තල් පොල්
- අඹ දඹ රඹ
- තුළින් තුළම
- පළින් පළම
- ඔල් යල්

## 11. මග විසිතුරු..........

**01. මග විසිතුරු ඇතුළත් සන්දේශ කාව්‍ය කුමක්ද ?**

- සැළලිහිණි සන්දේශය

**02. සැළලිහිණි සන්දේශයේ කතු හිමියෝ වන්නේ,**

- තොටගමුවේ ශ්‍රී රාහුල හිමි.

**03. සැළලිහිණි සන්දේශය ලියවුණු යුගය,**

- කෝට්ටේ යුගය

**04. එම යුගයේ එවකට රජකළ රජතුමා වනුයේ,**

- VI වන පරාක්‍රමබාහු රජතුමා

**05. කතුවරයාගේ අන්වර්ත නාමය ,**

- ෂඩ්භාෂා පරමේෂ්වර

**06. සන්දේශයක් යනු,**

- කිසිවකු දූත මෙහෙවරෙහි යොදා සන්දේශයක් හෙවත් අස්නක් නිශ්චිත ස්ථානයකට යවන සේ රචනා කරන ලද කාව්‍ය විශේෂයකි.

**07. සැළලිහිණි සන්දේශයේ පද්‍ය ප්‍රමාණය වන්නේ,**

- පද්‍ය 108

**08. සැළලිහිණි සන්දේශයේ අරමුණ**

- VI වන පරාක්‍රමබාහු රජුගේ කනිටු දියණිය වන ලෝකනාථ (උලකුඩ) දේවියට පුත් රුවක් ලබා දෙන ලෙස ඉල්ලමින් කැළණියේ විභීෂණ දෙවියන්ට ආයාචනා කිරීමයි.

**09. මෙම සන්දේශයේ ප්‍රතිග්‍රාහකයා වූයේ,**

- කැළණියේ විභීෂණ සුරිඳු

**10. සන්දේශය රැගෙන යන ලද ගමන් මාර්ගය කුමක්ද?**

- ජයවර්ධනපුර කෝට්ටේ සිට කැළණියේ විභීෂණ දේවාලය දක්වා.

**11. ගමනට ගතවන ලද කාලය,**

- දින 01 කි.

**12. මෙහි එන වැනුම් වනුයේ,**

- සැදෑ වැනුම
- මඟ වැනුම
- වන වැනුම

**13. දූතාශිර්වාදය පබැඳි විරිත,**

- යහගී විරිත

**14. දූත වර්ණනා පබැඳි විරිත,**

- උපජාති සැහැලි විරිත

**15. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ වෙනත් කෘති වනුයේ,**

- බුද්ධි ප්‍රසාදිනී
- පංචිකාප්‍රදීපය
- පරෙවි සන්දේශය
- කාව්‍යශේකරය
- සැළලිහිණි සන්දේශය

**16. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියෝ ෂඩ්භාෂා පරමේෂ්වර ලෙස හැඳින්වීමට හේතු වූයේ,**

- විවිධ භාෂා 06 ක් දැනසිටීම

**17. රාහුල හිමියන් දැන සිටි භාෂා 06 වන්නේ,**

- සංස්කෘත
- ප්‍රාකෘත
- මාගධී
- ඇභ්‍රංශ
- වෛශාඩි
- ශෞරසේනි

**18. මෙහි සඳහන් උපමා වනුයේ,**

- නිල තුරඟට නැඟෙමින් රිවි දෙවි සිරිත
- නිමල් සඳ පහන් වැලි වැලි පිට උදුළ
- පියුමිරා බඳ රන බරණ යුරු
- හිමසරි

**19. මෙහි ඇති රූපක,**

- වනසරි

**20. අනුප්‍රාසාත්මක යෙදුම්,**

- රිවි තැවුගේ පිපි කමලේ
- මත කොවුලේ තුරු වඳුලේ
- වන සැවුලේ මඟ අසලේ
- ගුරු බැවුලේ යව අවුලේ

## 12. කුරහන් ඉසිමුව කළුවර

**01. ඉපැරණි ගොවියා කෘෂිකර්මාන්තයේ නියැලුණු අංශ,**

- මඩ ගොවිතැන
- ගොඩ ගොවිතැන

**02. හේන් ගොවිතැන හඳුන්වන වෙනත් නම්,**

- සල ගොවිතැන
- ගොඩ ගොවිතැන

**03. කුරහන් ඉසිඹුව කළුවර බලාලා කවි අයත් කාව්‍ය විශේෂය වනුයේ,**

- ජන කවි - කුරක්කන් කවි

**04. කුරහන් කවිවල වස්තු විෂය,**

- ගොවිතැන සඳහා කැලෑ එළිපහන් කිරීමේ සිට කුරහන් වපුරා අස්වනු නෙළා ගන්නා තෙක් ගොවියාගේ අනේකවිධ අභියෝග, ගැටලු හා අත්දැකීම් ය.

**05. කුරක්කන් කවි හඬ නගා කියන අවස්ථාව,**

- රාත්‍රී කාලයේ නිදිවරමින් පාලුව, කාන්සිය, තනිකම, මඟ හැර ගැනීමට.

**06. ඉපැරණි ගොවියා කැලෑ එළිපෙහෙළි කරන මාසය,**

- දුරුතු මාසය ( ජනවාරි)

**07. කුරක්කන් වපුරන මාසය,**

- මැදින් මාසය (මාර්තු)

**08. ජනකවියක සාහිත්‍ය අගය මනින සාධක වනුයේ,**

- අව්‍යාජත්වය
- සරලත්වය
- අලුත් උපමා රූපක
- සංක්ෂිප්තභාවය
- සංයමය
- වචන භාවිතය
- අවස්ථා නිරූපණය

**09. කුරහන් ඉසිමුව කළුවර බලලා උපුටාගන්නා ලද කෘතිය වනුයේ,**

- සිංහල ජනකවි සංග්‍රහය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## 13. අපට වැසිකිලියක්........

**01. කෙටි කතාව යනු කුමක්ද ?**

- එක හුස්මට පැවසීම හෝ කියවීමට හැකි සංක්ෂිප්ත කතාවකි.

**02. කෙටිකතාවක අන්තර්ගත මූලික ලක්ෂණ,**

- එක් ප්‍රබල චරිතයක්
- එක් ප්‍රබල සිද්ධියක්
- පරිකල්පනය

- කතා වින්‍යාසය
- සියල්ල එකට කැටිව තිබීම
- සංවිධානාත්මක බව
- ධාරණාවේ ඒකීයත්වය
- ජීවන දෘෂ්ටිය
- පරිසර වර්ණනා
- නිර්මාණාත්මක භාෂා ලක්ෂණ
- සංකේත නිරූපණය

**03. කෙටි කතාවේ ගැබ්වන අනිවාර්යය ලක්ෂණයන්,**

- එක් දුබල ධාරණාවක් තිබීම.

**04. කෙටි කතා බිහිවීමට හේතු වූයේ,**

- ශාස්ත්‍රීය වාද විවාද ඇති වීම.
- පුවත්පත් හා සඟරා බිහිවීම.

**05. කතා ප්‍රවෘත්තිය යනු,**

- කාලයකට අනුව අනුපිළිවෙලින් ඉදිරිපත් කෙරෙන සිදුවීමය.

**06. උත්තම පුරුෂ දෘෂ්ටිකෝණය යනු,**

- "මම" නැමැති පුද්ගලයාට සිදුවන අත්දැකීම් අනුසාරයෙන් කතාව කිරීමේ ක්‍රමයයි.

**07. ප්‍රථම පුරුෂ දෘෂ්ටිකෝණය යනු,**

- අත්දැකීම් හා බැඳුණු චරිත අතරින් එක චරිතයක් තෝරාගෙන කතාව විකාශනය කිරීමයි.

**08. ජීවන දෘෂ්ටිය යනු,**

- ලේඛකයා සමස්ත වශයෙන් ජීවිතය, මනුෂ්‍යත්වය හෝ සමාජ ක්‍රියාවලිය වීසයෙහි ඔහු හෙලන දෘෂ්ටිය වේ.

**09. ඒකාබද්ධතාව යනු,**

- කතා ප්‍රවෘත්තයි, කතා වින්‍යාසය, චරිතාංග හා වර්ණනා අතර ඇති තර්කානුකූල සබඳතාවයි.

**10. "අපට වැසිකිලියක්" කෙටි කතාවේ රචකයා වනුයේ,**

- කේ. ජයතිලක ( කළුආරච්චිගේ ජයතිලක)

**11. කෙටිකතා කරුවා පිදුම් ලැබූ සම්මාන,**

- සාහිත්‍ය රත්න සම්මානය
- සාහිත්‍ය සයුරී සම්මානය

**12. "අපට වැසිකිලියක්" කෙටි කතාව ඇතුළත් කෙටි කතා සංග්‍රහය,**

- නොනිමි සිත්තම සහ තවත් කෙටි කතා.

**13. "අපට වැසිකිලියක්" කෙටි කතාව ලියා ඇති දෘෂ්ටි කෝණය,**

- උත්තම පුරුෂ දෘෂ්ටි කෝණය

**14. කෙටි කතාවේ එන ප්‍රධාන චරිත,**

- කථකයා (මම)
- අක්කා
- තාත්තා

**15. කෙටි කතාවේ සෙසු චරිත,**

- මල්ලී
- සුගතන්
- කුණු ඉස්පැට්ටර් (සෞඛ්‍ය පරීක්ෂක)
- අම්මා

**16. මෙම කෙටි කතාවේ ජීවන දෘෂ්ටිය**

- ගැමියන්ගේ ගතානුගතික සිරිත් විරිත්, ඇවතුම් පැවතුම් එක මෙහොතකින් වෙනස් කළ නොහැකි වුවත්, කාලීනව ක්‍රමක් ක්‍රමයෙන් අනුවර්තනය විය හැකි බව.

**17. මෙහි සඳහන් උපමා,**

- කම්මලේ සිටින බල්ලාට යකඩ තලන හඬ මෙන්
- වර්ෂාවක් වැස පායන්නාක් මෙන්
- ගෙදරට පුංචි පැටියකු ඇති වූවක් මෙන්

**18. මෙහි සඳහන් රූපක,**

- කෝදුරු තෙල් හත්පට්ටියකින් සොයන්නට පටන් ගනී.
- මකරා නිදාගත්තා විනා මිය ගියේ නැත.

# 14. දියමන්ති මාලය..........

**01. දියමන්ති මාලය උපුටාගත් පරිවර්තන කෘතිය,**

- දියමන්ති මාලය සහ වෙනත් ශ්‍රේෂ්ඨ කෙටි කතා

**02. සිංහලට පරිවර්තනය කළ කතුවරයා,**

- කේ.ජී. ජයතිලක

**03. දියමන්ති මාලය කෙටිකතාවේ රචකයා,**

- ගී ද මෝපසං (ප්‍රංශ කෙටි කතා කලාවේ පුරෝගාමියා)

**04. ගී ද මෝපසං උපත ලැබුවේ,**

- 1850 අගෝස්තු 05

**05. ගී ද මෝපසං ගේ විපත සිදුවූයේ,**

- 1893 ජූලි 06

**06. ගී ද මෝපසං ගේ ප්‍රථම කෙටි කතාව,**

- බූල් ද ස්වීෆ් (ඉටි බෝලය හෙවත් තෙල් බෝලය)

**07. ගී ද මෝපසං ගේ ගුරුවරයා,**

- ගුස්තාව් ෆ්ලෝබෙයාර්

**08. ගී ද මෝපසං ගේ ප්‍රථම නවකතාව**

- යුන් වී හෙවත් ජීවිතය

**09. ගී ද මෝපසං ගේ නවකතා**

- යුන් වී
- බෙල් ආමි
- ඔරියොල් කන්ද
- පියෙර් සහ ශෝං
- නෝතර් කර

**10. ප්‍රංශ කෙටි කතා කලාවේ මූලික ලක්ෂණ,**

- මුල, මැද, අග පරිපූර්ණ පුවතකි

- කුතුහලය ජනනය කරන සිදුවීම් පෙළකි
- ජීවිත ස්වභාවය අතිශයෝක්තියට නගා නිරූපණය කිරීම

**11. දියමන්ති මාලය කෙටි කතාවේ එන චරිත,**

- මැටිල්ඩා මහත්මිය
- ෆොරෙස්ටියර් මහත්මිය
- ලොයිසල් මහතා

**12. දියමන්ති මාලය කෙටිකතාව විකාශනය වී ඇති ආකාරය,**

- සාදයට පෙර ලොයිසල්ගේ පවුලේ ජීවිතය
- සාදයට සහභාගී වීම
- සාදයෙන් පසු පවුලේ ජීවිතය
- රහස හෙළිවීම

**13. දියමන්ති මාලය කෙටිකතාව ඉදිරිපත් කර ඇති දෘෂ්ටි කෝණය,**

- ප්‍රථම පුරුෂ දෘෂ්ටි කෝණය

## 15. දැතේ කරගැට සිඹ සනසන්නට........

**01. දැතේ කරගැට සිඹ සනසන්නට යන කවි පන්තියේ රචකයා,**

- මහගම සේකර

**02. දැතේ කරගැට සිඹ සනසන්නට යන කාව්‍ය ඇතුළත් පද්‍ය සංග්‍රහය,**

- ප්‍රබුද්ධ කාව්‍ය සංග්‍රහය

**03. මහගම සේකරයන්ගේ උපත,**

- 1929 අප්‍රේල් 07

**04. මහගම සේකරයන්ගේ විපත,**

- 1976 ජනවාරි 14

**05. දැතේ කරගැට සිඹ සනසන්නට පාඩම අයත් කොටස පළවූ කම,**

- නොපෙළ ගීත කෘතියේ ප්‍රාර්ථනා නමිනි.

**06. මෙම පදවැලට සංගීය සැපයූයේ,**

- ඩබ්.ඩී. අමරදේවයන් විසිනි.

**07. මෙම ගීතය ගුවන් විදුලි ගීතයක් ලෙස ගායනය කරනු ලැබුයේ,**

- විමලා අමරදේවයන් විසිනි.

**08. මෙම ගීතයෙන් ජනනය වනුයේ,**

- දේශයේ අතීත ශ්‍රී විභූතිය
- ජාතිකාභිමානය
- ශ්‍රමාභිමානය

**09. මහගම සේකරයන් විසින් පරිවර්තනය කළ ග්‍රන්ථය,**

- ධවල සේනාංකය (White company)

**10. එහි පරිවර්තන ග්‍රන්ථයේ රචකයා,**

- ශ්‍රීමත් ආතර්කොනන් ඩෝයිල්

**11. මහගම සේකරයන්ගේ ප්‍රථම ගද්‍ය කෘතිය,**

- ව්‍යාංගයා (1960)

**12. මහගම සේකරයන්ගේ පද්‍ය කෘති,**

- රාජ ජයතිලක ලයනල් හා ප්‍රියන්ත
- බෝඩිම - (1970)
- නොමියෙමි - (1973)
- ප්‍රසිද්ධ - (1977)
- සක්වාලිහිණි - (1962)
- හෙට ඉරක් පායයි - (1963)
- මක් නිසාද යත්

**13. මහගම සේකරයින්ගේ නවකතා,**

- තුංමංහන්දිය - (1967)
- මනෝමන්දිර - (1971)

**14. මහගම සේකරයන්ගේ නාට්‍ය,**

- ස්වර්ණතිලකා
- කුණ්ඩලකේහි
- සද්දන්ත
- හංස ගීතය
- සොර පච්ච

**15. මහගමසේකරගේ ස්වභාව සෞන්දර්ය වර්ණනා කරන ගීත,**

- තල මලේ ගීතය
- ජීවිතයත් මුහුද වගෙයි
- ඉරට මුවාවෙන් ඉදගෙන ඉස පීරනවා
- අන්න බලන් සඳ රන් තැටියෙන්
- සුමුදු සුදු මුතු තලාවේ

**16. මහගමසේකරයන්ගේ දාරක ප්‍රේමය ඉස්මතු කරන ගීත,**

- බිළිඳු තොලක කිරි සුවඳ උරන්නයි
- ඉහළ වෙළේ ඉස්මත්තේ
- පාලු අඳුර අහස මමයි

**17. මහගම සේකරයන්ගේ ස්ත්‍රී පුරුෂ රූප සෞන්දර්යය දනවන ගීත,**

- ඔබේ නමින් සෑය බඳිමි.
- ඈත කඳුකර හිමව් අරණේ

**18. මහගම සේකරයන් ලියූ ශාස්ත්‍රීය කෘතිය,**

- සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ

**19. මහගම සේකරයන්ගේ චිත්‍රපට ගීත**

- ගැටවරයෝ - හාරිච්චි බෝරිච්චි සහ ඈත ගව් ගණන් දුරින්
- රන් සළු - මුනිසිරිපා
- සාර විට - මේ සිංහල අපගේ රටයි
- සත් සමුදුර - සිනිදු සුදු මුතු වලාවේ
- පරසතු මල් - අද පමණයි ඉතිරිව පවතින්නේ
- ආදරයයි කරුණාවයි - දුක සැප දෙකටම උල්පත එක වේ.

**20. මහගම සේකරයින්ට ආචාර්ය උපාධිය ලැබුණේ,**

- සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ පර්යේෂණ ග්‍රන්ථය සඳහා (මියගිය අයෙකු සඳහා ආචාර්ය උපාධිය පිරිනැමූ ප්‍රථම අවස්ථාව - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

# 16. වස්සානය..............

**01. වස්සානය කාව්‍ය රචනා කරනු ලැබුවේ.**

- රත්න ශ්‍රී විජේසිංහ

**02. මොහුගේ ළමා කාලයේ පළවූ කවි සඟරාව.**

- ගීතාංජලී

**03. එම කාව්‍යයට පාදක වූ ඡායාරූපය**

- ඔරුපදින කතකගේ රුව

**04. මොහු විසින් රචිත මුල්ම කාව්‍ය සංග්‍රහය,**

- බිය නොවන් අයියණ්ඩි - 1979

**05. රත්න ශ්‍රී විජේසිංහයන්ගේ උපත,**

- 1953 ජූලි 02

**06. වස්සාන පද්‍ය පන්තියට පාදක වූයේ,**

- ගුරුවරයෙකු ලෙස මොනරාගල හුලංදාව ගමේ හුලංදා ඔහ අසල ජීවත් වූ කාලයේ අත්දැකීමය .

**07. වස්සාන කාව්‍ය සංග්‍රහයේ එන කාව්‍ය නිර්මාණ,**

- පරමල්
- සෙත් කවිය
- නම් තැබීම
- තාත්තා
- වස්සානය
- සීතාව
- පරිණාමා

**08. වස්සාන පද්‍ය පන්තියට වස්තු විෂය වූයේ,**

- වැස්ස නිසා සපිරි හුලංදා ඔයෙහි ආනන්දනීය සුන්දරත්වය

**09. රත්න ශ්‍රී විජේසිංහ විසින් රචිත කාව්‍ය නිර්මාණ,**

- බිය නොවන් අයියණ්ඩි (කාව්‍ය සම්මාන)
- වස්සානය

- තරු ලකුණ
- සුභ උදෑසනක් (රාජ්‍ය සම්මාන)
- සල්ගහයට
- සන්ධ්‍යා තීර්ථය (2010 විද්‍යෝදය සාහිත්‍ය සම්මානය)

**10. රත්න ශ්‍රී විජේසිංහ විසින් රචිත ගීත නිර්මාණ**

- වංක ගිරි අරණේ (1990 රාජ්‍ය සම්මාන)
- සුදු නෙළුම (රාජ්‍ය සම්මාන)
- ගංගා ගීතය (රාජ්‍ය සම්මාන)
- ආලකමන්දා
- නෙත නිලුපුල් (රාජ්‍ය සම්මාන)
- ඉරබටු තරුව
- ලස්සනම අහස මතත සිතුවිලි

**11. රත්න ශ්‍රී විජේසිංහගේ ලිපි සංග්‍රහය,**

- ලස්සන අහස
- බටු ගහ යට
- ලියවැල
- අත්පසුර

**12. රත්න ශ්‍රී විජේසිංහගේ විමර්ශන කෘති,**

- මහගම සේකර හා සමාජ යථාර්තය

**13. රත්න ශ්‍රී විජේසිජහයන්ගේ ළමා කෘති**

- රන් කිරි කැටි
- පැණි කුරුල්ලා
- ගල් අරඹේ ඇතින්නිය
- සූරිය උදාවනතුරු
- සැළලිහිණියෝ
- ළහිරු මඬල
- රතු කිකිළි සහ තවත් කතා
- සින්දු කියන උණ පඳුරු (රාජ්‍ය සම්මාන)

**14. රත්න ශ්‍රී විජේසිංහගේ ගී සංකල්පනා**

- මගේ බිසවුනේ අසාපන්
- කිරුළ මුතු ලිහී
- චන්ද්‍ර මණ්ඩලේ සැකසුණු පුංචි සාවියේ

- ලෙන්චිනා මගේ නංගියේ
- බිම්බරක් සෙනඟ ගැවසුණු

**15. මොහු පිදුම් ලැබූ වෙනත් සම්මාන**

- ජපන් බූර්කා සම්මානය

**16. මොහුගේ නිර්මාණ මෙහෙවර විමංසනය කරමින්**

- රත්න ශ්‍රී නව කවියේ චන්ද්‍රෝදය

**17. එහි රචකයා**

- සමුද්‍ර වෙත්තසිංහ

**18. රත්න ශ්‍රී විජේසිංහයන් භාවිතා කළ පද්‍ය උපක්‍රම,**

- උත්ප්‍රාසවත් බස් වහර
- ව්‍යාංග්‍යාර්ථවත් බස් වහර
- රූපවාර්ථවත් බස් වහර
- අනුප්‍රාසාත්මක බස් වහර
- කටවහර හා ජනවහර භාවිතා කිරීම.